ආයතනවල යුතුකම් පහක් ලියන්න. (ල. 05)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

09 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය : පැය දෙකයි

නම / විභාග අංකය :

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) "ඔබ කුමක් කළත් හොඳ කෙනෙක් වන්න." යනුවෙන් ප්‍රකාශ කළේ,
1. මහත්මා ගාන්ධි
2. ඒබ්‍රහම් ලින්කන්
3. තෙරේසා මව්තුමිය
4. ජෝර්ජ් වොෂින්ටන්

(02) සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලෙන් ඉටුවිය යුතු කාර්යයකි,
1. ආදර්ශයෙන් මඟ පෙන්වීම
2. යහපත් ආකල්ප ඇති කිරීම
3. සමාජ යුතුකම් හා වගකීම් ඉටු කිරීම
4. තිරසාර සාමය සඳහා කටයුතු කිරීම

(03) ආගම් අතර සහජීවනය ඇති කිරීමට කටයුතු කළ 'පත්සලේ පියතුමා',
1. බෞද්ධාගමිකයෙකි
2. කතෝලික භක්තිකයෙකි
3. හින්දු භක්තිකයෙකි
4. ඉස්ලාම් භක්තිකයෙකි

(04) 'රට වට බැඳි රන් වැට' යන ආදර්ශ පාඨය දක්වෙන්නේ,
1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ය
2. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ය
3. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ය
4. ශ්‍රී ලංකා පොලීසියේ ය

(05) ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් විසඳීමට පිහිටුවා ඇති විකල්ප ආයතනයකි,
1. සාකච්ඡා මණ්ඩප
2. දිසා අධිකරණය
3. අභියාචනාධිකරණය
4. සමථ මණ්ඩලය

(06) 1998 අංක 50 දරන පාර්ලිමේන්තු පනතින් පිහිටුවන ලද්දේ,
1. සමථකරණය
2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම
3. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
4. ජාතික ආරක්ෂාව පිළිබඳ කෙටුම්පත

(07) තාක්ෂණික වෙනස්වීම් නිසා ඇති වූ හිතකර බලපෑමක් නොවන්නේ,
1. සමාජය සංකීර්ණ වීම
2. වැඩ පහසු වීම
3. ඵලදායීතාව වැඩි වීම
4. සම්පත් නාස්තිය අවම වීම

(08) 'අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී' යනුවෙන් සඳහන් කළේ,
1. මාර්ටින් වික්‍රමසිංහ මහතා
2. කුමාරතුංග මුනිදාස මහතා
3. මහගමසේකර මහතා
4. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් මහතා

(09) කාර්මික අංශයට අයත් රැකියා වර්ගයක් නොවන්නේ,
1. මෘදුකාංග ශිල්පීන්
2. ඩ්‍රෝන කැමරා ශිල්පීන්
3. පරිගණක තාක්ෂණ ශිල්පීන්
4. ගෘහ අලංකරණ ශිල්පීන්

(10) සමූපාකාර ව්‍යාපාරයේ පියා,

1. රොබට් ඕවන්
2. රොබට් නොක්ස්
3. මැක්ස්වෙල්
4. තෝමස් අල්වා එඩිසන්

(11) දේශීය ඖෂධයක් වන්නේ,

1. කැකුණ
2. ඇටඹ
3. බඹර වැල්
4. බදුල්ල

(12) සියලු දෙනාටම අයිතිවාසි ාම් හිමිවන පාලන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වූ විද්වතෙකි,

1. ඒබ්‍රහම් ලින්කන්
2. සීලර්
3. කැත්ලින් ගෆ්
4. මර්ඩොක්

(13) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක් නොවන්නේ,

1. ඉන්දියාව
2. චීනය
3. ප්‍රංශය
4. ජපානය

(14) ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්ම ා වන රටකි,

1. උතුරු කොරියාව
2. ශ්‍රී ලංකාව
3. ඉන්දියාව
4. ඇමෙරිකා එක්සත් ජනපදය

(15) ඡන්ද බලය ලබා ගැනීම සඳහා සපුරාගත යුතු සුදුසුකමකි,

1. වයස අවුරුදු 16 සම්පූර්ණ වීම
2. ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් නොවීම
3. ඡන්දය ප්‍රකාශ කිරීම ාදහා ඇති අයිතිය හිමිකර නොතිබීම
4. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම

(16) පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පළාත් සභාවට පවරා ඇත්තේ,

1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 09 වන සංශෝධනයෙනි.
2. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 13 වන සංශෝධනයෙනි.
3. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 10 වන සංශෝධනයෙනි.
4. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 20 වන සංශෝධනයෙනි.

(17) නගර සභා පිහිටුවීම ආරම්භ වූයේ,

1. 1865 දී ය
2. 1871 දී ය
3. 1940 දී ය
4. 1946 දී ය

(18) බස්නාහිර පළාතේ මුළු මහනගර සභා සංඛ්‍යාව වන්නේ,

1. 01 කි
2. 03 කි
3. 05 කි
4. 07 කි

(19) ප්‍රාදේශීය අවශ්‍යතා විවිධත්වයට බලපාන කරුණක් නොවන්නේ,

1. ජන සනත්වය
2. සම්පත්වල ව්‍යාප්තිය
3. සංස්කෘතික විවිධත්වය
4. භූගෝලීය පසුබිම

(20) කසළ බැහැර කිරීමේ දී නිල් වර්ණය සහිත බඳුනට බැහැර කළ යුත්තේ,

1. ප්ලාස්ටික්
2. කඩදාසි
3. වීදුරු
4. ආහාර

(ලකුණු 2 x 20 = 40)



CamScanner

## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරාගනු ලබන අනෙක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.)**

---

(01) 1. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමට දායක වන ආයතන දෙකක් නම් කරන්න.

2. නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රධාන වර්ග දෙකකි. එය නම් කරන්න.

3. නීතිය බලාත්මක කිරීම සඳහා පවතින ආයතන දෙකක් නම් කරන්න.

4. ''තාක්ෂණය'' යන්න හඳුන්වන්න.

5. විවිධාංගීකරණය වී ඇති තේ නිෂ්පාදනයට උදාහරණ දෙකක් ලියා දක්වන්න.

6. සහජීවන ගුණාංග දෙකක් නම් කරන්න.

7. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක් ද?

8. ලෝකයේ රටවල් අන්‍යෝන්‍ය රැඳියාවෙන් යුක්තව කටයුතු කිරීම සඳහා විවිධ සංවිධාන පිහිටුවාගෙන ඇත. එවැනි සංවිධාන දෙකක් නම් කරන්න.

9. පළාත් පාලන ආයතන දෙකක් සඳහන් කරන්න.

10. පළාත් පාලන ආයතන මගින් සපයන ළමුන්ට ප්‍රයෝජනවත් වන සේවා දෙකක් ලියන්න.

(ල. 2 x 10 = 20)

(02) 1. සමාජ සුරක්ෂිතතාව යන්න පැහැදිලි කරන්න. (ල. 02)

2. සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායකත්වය දක්වන සමාජ සංවිධාන හයක් නම් කරන්න. (ල. 03)

3. ආගමික ආයතන සමාජ සුරක්ෂිතතාව සඳහා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබන අතර, ඊට නිදසුන් පහක් ලියා දක්වන්න. (ල. 05)

(03) 1. නීතියේ මූලාශ්‍ර දෙකක් ලියා දක්වන්න. (ල. 02)

2. ආරවුලක් සමථ මණ්ඩලය වෙත යොමු කළ හැකි ක්‍රම තුනක් ලියන්න. (ල. 03)

3. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ඉටු කෙරෙන ප්‍රධාන සේවා පහක් දක්වන්න.

(ල. 05)

(04) 1. තාක්ෂණික වෙනස්වීම් සමග ඇති වූ සමාජ වෙනස්වීම් දෙකක් ලියා දක්වන්න. (ල. 02)

2. සංවර්ධන ක්‍රියාවලිය සඳහා යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න. (ල. 03)

3. රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුනක් දක්වා ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(ල. 05)

(05) 1. සමූපාකාර ව්‍යාපාරයේ අරමුණු දෙකක් දක්වන්න. (ල. 02)

2. විවිධ සේවා සමූපාකාර සමිතිය මගින් ඉටුවන සේවා තුනක් ලියන්න. (ල. 03)

3. පාසල් සමූපාකාර සමිතියෙන් පාසල් දරුවන්ට ලබාගත හැකි සේවා පහක් ලියන්න.

(ල. 05)



CamScanner

(06) 1. ප්‍රජාතන්ත්‍රවාදයේ ආකාර දෙකක් දක්වන්න. (ල. 02)

2. පුරවැසියෙකු සතු අයිතිවාසිකම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

3. විවිධ රටවල ක්‍රියාත්මකවන දේශපාලන පක්ෂ ක්‍රම තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)

(07) 1. බ්‍රිතාන්‍ය පාලන යුගයේ නිකුත් කරන ලද පළාත් පාලන ආයතන සම්බන්ධ ආඥා පනත් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

2. ප්‍රාදේශීය සභාවක ව්‍යුහය දක්වන්න. (ල. 03)

3. ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනාගෙන ඒට ගැළපෙන පරිදි සැලසුම් සකස් කළ යුතුය. එවැනි සැලසුම් තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)



CamScanner

## දෙවන වාර පරීක්ෂණය

**09 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය** **විසඳුම් පත්‍රය**

### I - කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. 2 | 02. 1 | 03. 2 | 04. 3 | 05. 4 |
| 06. 3 | 07. 1 | 08. 2 | 09. 4 | 10. 1 |
| 11. 3 | 12. 2 | 13. 2 | 14. 1 | 15. 4 |
| 16. 2 | 17. 3 | 18. 4 | 19. 1 | 20. 2 |

(ලකුණු 2 x 20 = 40)

### II - කොටස

(01) 1. පවුල, පාසල, ආගමික ආයතන, සමාජ ආයතන (ල. 02)

2. දේශීය නීතිය, අන්තර්ජාතික නීතිය (ල. 02)

3. අධිකරණය, ශ්‍රී ලංකා පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා (ල. 02)

4. 'තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොදාගන්නා ක්‍රමවේදය යි. (ල. 02)

5. ක්ෂණික තේ, කාබනික තේ (දියර තේ), කළු තේ, හරිත තේ, පෙට්ටිවල ඇසුරුම් කරන ලද තේ, කුඩා පැකට්වල ඇසුරුම් කරන ලද තේ (ල. 02)

6. සහයෝගයෙන් කටයුතු කිරීම, බෙදා හදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම, සුහද බව, අන්‍යෝන්‍ය විශ්වාසය, අවංක බව, සුබවාදී බව, යුතුකම් ඉටු කිරීම (ල. 02)

7. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට හා පාලන කටයුතුවලට පුරවැසියන් සෘජුව සම්බන්ධ වීමයි. (ල. 02)

8. එක්සත් ජාතීන්ගේ සංවිධානය, සාර්ක් සංවිධානය, යුරෝපා හවුල, ආසියාන් සංවිධානය (ල. 02)

9. මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා (ල. 02)

10. පුස්තකාල, කියවීම් ශාලා, ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි, ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා ආගමික හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ල. 02)

(මුළු ල. 20)

(02) 1. සමාජ සුරක්ෂිතතාව යනු සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වීමටත්, ජීවිතය යහපත් ලෙස පවත්වාගෙන යාමටත්, සමාජයෙන් රැකවරණය හා ආරක්ෂාව හිමි විය යුතුය. (ල. 02)

2. ළමා සමාජ, ක්‍රීඩා සමාජ, යෞවන සමාජ, ග්‍රාම සංවර්ධන සමිති, ගොවි සමිති, ගුහ සාධන සමිති, වැඩිහිටි සමිති, මරණාධාර සමිති, ආගමික සමිති, සමුපාකාර සමිති, වෘත්තීය සමිති, ශිෂ්‍ය සමිති (ල. 03)

3. යහපත් ආකල්ප ඇති කිරීම, විනය හා ශික්ෂණය ඇති කිරීම, ආධ්‍යාත්මික සංවර්ධනයට මග කියා දීම, ගුණගරුක පුරවැසියන් බිහිකිරීම, මධ්‍යසාර / මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පහදා දී ඉන් මුදවා ගැනීම, සමාජ විරෝධී හා විෂමාචාර ක්‍රියාවල අහිතකර බලපෑම් අවබෝධ කර දීම හා ඉන් මුදවා ගැනීම, සහයෝගීතාව හා උපකාරය හුරු කිරීම, සිරිත් විරිත් සම්ප්‍රදාය හුරු කිරීමට හා ආරක්ෂා කිරීමට ඉගැන්වීම, ජීවිතය පිළිබඳව සුබවාදී නිවැරදි දැක්මක් ඇති කිරීම, ජාතික සමගිය, ජාතික ඒකාග්‍රතාව ඇති කිරීම සඳහා සහාය වීම, තිරසර සාමය සඳහා කටයුතු කිරීම (ල. 05)

(මුළු ල. 10)

(03) 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ව්‍යවස්ථා (අණපනත්), සිරිත් විරිත්, අධිකරණ තීරණ, නීති විශාරදයන්ගේ මත, ආගම (ල. 02)

2. පොලීසිය මගින්, අධිකරණය මගින්, පෞද්ගලික යොමු කිරීමක් මගින් (ල. 03)

3. ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුවත් කිරීම් පිළිබඳව සෘජු දුරකතන අංකය (1929) පවත්වාගෙන යාම, ළමා අයිතිවාසිකම් පනතට අදාළ ළමා අයිතිවාසිකම් කඩවීමක් සිදු වන්නේ නම් ඊට ක්ෂණිකව මැදිහත් වීම, ළමා අපයෝජන සම්බන්ධ නෛතික මැදිහත්වීම්, අධ්‍යාපනික ප්‍රදර්ශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්, වින්දිත දරුවන්ට මනෝ සමාජීය සේවාවන් සැපයීම, සුනාමි - මා පිය කැපකරු වැඩසටහන, විශේෂ පොලිස් විමර්ශන (ල. 05)

(මුළු ල. 10)

(04) 1. මිනිසාගේ පරිභෝජන රටාව වෙනස් වීම, නව රැකියා රැසක් බිහි වීම, නව විලාසිතා බිහි වීම, නවීන වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ඇති වීම, ආහාර පානවල නිෂ්පාදනය හා භාවිතය වෙනස් වීම, විවේකය හා විනෝදය ගත කරන ආකාරය වෙනස්වීම, සමාජ සම්බන්ධතා පුළුල්වීම හා වේගවත් වීම, පැරණි සාම්ප්‍රදායික ක්‍රම ශිල්ප අභාවයට යාම, මිනිසාගේ සිතුම් පැතුම් වෙනස් වීම (ල. 02)

2. සම්පත් අපතේ යාම වැළැකීම, ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම, පරිසර හානිය අවම වීම, පාරිසරික තුල්‍යතාව රැක ගත හැකි වීම, රටේ ආර්ථිකයට දරාගත හැකි වීම (ල. 03)



CamScanner

3. නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය (ල. 03)
මෙයින් දෙකක් විස්තර කිරීමට (ල. 02)
(මුළු ල. 10)

(05) 1. සාමාජික අවශ්‍යතා පිරිමසාලීම, මිනිසාට වඩා හොඳින් ජීවත් වීමට මාර්ගයක් ඇති කිරීම, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහාය වීම, තනි තනිව ඉටු කරගත නොහැකි අවශ්‍යතා සාමූහික ශක්තියෙන් පහසුවෙන් ඉටු කරගැනීම (ල. 02)

2. ජනතාවට සේවා සැපයීම සඳහා සමුපකාර ප්‍රාදේශිකව පවත්වාගෙන යාම, ණය දෙන සමිති පවත්වාගෙන යාම, අවමංගල්‍ය සේවා සැපයීමට දායක වීම, ප්‍රවාහන හා ඉන්ධන සේවා සැපයීම, ආරෝග්‍යශාලා සේවා පවත්වාගෙන යාම, බැංකු සේවා, ස්වයං සේවා අලෙවිසල්, කිරිහල් / ආපන ශාලා, අධ්‍යාපන සේවා, රක්ෂණ සේවා, ළදරු පාසල්, උකස් කටයුතු (ල. 03)

3. පාසල් ලිපිද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම, ආහාර ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම, ක්‍රීඩා උපකරණ පහසු මිලට ලබා ගැනීම, නායකත්ව පුහුණු, සාමූහික ජීවන රටාවකට හුරු වීම, සෙසු අවශ්‍යතා සපුරාලීම (ල. 05)
(මුළු ල. 10)

(06) 1. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය, වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය (ල. 02)

2. ජීවත් වීමේ අයිතිය, නමක් හා ජාතියක් ලැබීමට ඇති අයිතිය, අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය, නීත්‍යානුකූල රැකියාවක යෙදීමට ඇති අයිතිය, තමන් කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය, පාලකයන් තෝරා ගැනීමට ඇති අයිතිය, තමන් කැමති ස්ථානයක / ප්‍රදේශයක ජීවත් වීමේ අයිතිය, තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය දීමේ අයිතිය, වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය (ල. 03)

3. <u>ඒක පක්ෂ ක්‍රමය</u> - යම් රටක ක්‍රියාත්මක වන්නේ එක් දේශපාලන පක්ෂයක් පමණක් නම් එය ඒක පක්ෂ ක්‍රමයකි. සමාජවාදී රටවල ක්‍රියාත්මක වෙයි.
නිදසුන් - උතුරු කොරියාව, කියුබාව

<u>ද්වි පක්ෂ ක්‍රමය</u> - යම් රටක ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා සක්‍රියව ක්‍රියාත්මක වන්නේ පක්ෂ දෙකක් නම් එය ද්වි පක්ෂ ක්‍රමයකි. මෙම රටවල තවත් පක්ෂ තිබිය හැකි ය. එහෙත් ඒවා ආණ්ඩු බලය ලබා ගැනීමට තරම් බලවත් නැත. ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා කටයුතු කරන්නේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් පමණි. නිදසුන් - ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය

<u>බහු පක්ෂ ක්‍රමය</u> - යම් රටක පක්ෂ දෙකකට වඩා වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන්නේ නම් එවැනි රටවල් බහු පක්ෂ ක්‍රියාත්මක වන රටවල් ලෙස හැඳින්වේ. ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා පක්ෂ කිහිපයක් එකට එකතු වීම බහු පක්ෂ ක්‍රමයක් සහිත රටවල දක්නට ලැබෙන ලක්ෂණයකි.
නිදසුන් - ශ්‍රී ලංකාව, ඉන්දියාව (ල. 05)
(මුළු ල. 10)

(07) 1. ක්‍රි. ව. 1865 දී අංක 17 දරන මහනගර සභා ආඥාපනත මගින් කොළඹ, මහනුවර, ගාල්ල යන මහනගර සභා පිහිටුවීම, ක්‍රි. ව. 1871 අංක 26 දරන ගම්කාර්ය සභා ආඥා පනත මගින් 1871 ගම්කාර්ය සභා පිහිටුවීම, ක්‍රි. ව. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත මගින් 1940 දී නගර සභා පිහිටුවීම, 1946 අංක 03 දරන සුළු නගර සභා පනත මගින් 1946 දී සුළු නගර සභා පිහිටුවීම (ල. 02)

2. ප්‍රාදේශීය සභාවක ව්‍යුහය
↓
සභාපති (මහජන නියෝජිත)
↓
උපසභාපති (මහජන නියෝජිත)
↓ ↓
මහජන නියෝජිතවරුන් (ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්) | රාජ්‍ය නිලධාරීන්
↓
ලේකම්
↓
අනෙකුත් නිලධාරීන්
උදා - කාර්මික නිලධාරීන්
කළමනාකරණ සහකාර
රියැදුරු, සුළු සේවක, කම්කරු (ල. 03)

3. ජල සම්පාදනය, කසළ බැහැර කිරීම, ඩෙංගු මර්දනය වැනි වසංගත රෝග පාලනයට කටයුතු කිරීම යනාදී කරුණු 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කිරීමට (කරුණු 03ට ල. 03)
(පැහැදිලි කිරීමට ල. 02)
(මුළු ල. 10)



CamScanner